Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# දින 100 වැඩසටහනෙහි විවෘතභාවය ප්‍රවර්ධනය කිරීමෙහි හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමෙහි ලා පියවර ගැනීම අවශ්‍යව තිබේ.

දැනට ක්‍රියාත්මකව පවතින, රජයේ දින 100 ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි සාමාන්‍ය දිශානතිය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුටින් පිළිගනී. දශක කිහිපයක් පුරා සිදුවූ දැරිය නොහැකි මට්ටමකවූ පහරකෑමකින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාදාමයන් සහ ආයතනයන්හි පවතින්නේ ප්‍රතිසංස්කරණ හා අලුත් කිරීම් පිළිබඳව වූ දැඩි අවශ්‍යතාවයකි. පුළුල් ප්‍රතිපත්තීන් වශයෙන් ගත් කල විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවීම, තොරතුරු දැන ගැනීමේ වූ නිදහස පිළිබඳව වූ නීතිකරණ සහ පාර්ලිමේන්තු කමිටු ක්‍රමයෙහි සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ යනාදිය වෙත අපි කිසිදු පැකිලීමකින් තොරව සහාය පළකර සිටින්නෙමු. මීළඟ පාර්ලිමේන්තුවේ දී ද, බලය බෙදීමේ සහ බලය බෙදාහදා ගැනීමේ අපගේ ආකෘතියෙහි සහ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි සිදුවිය යුතු ප්‍රධාන වෙනස්කම් ඇතුළත් වන ප්‍රජාතන්ත්‍රවාදය සහ බහුත්වවාදය (Pluralism) තහවුරු කරන්නාවූ වැඩිදුර ප්‍රතිසංස්කරණ නොකඩවා සිදුවිය යුතුයයි අපි විශ්වාස කරන්නෙමු.

නව රජය බලයට පත්වීමෙන් පසු සිය පළමු මාසයද සම්පූර්ණකොට ඇත. නමුත් රජය තුළ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය සිදුකරනු ලබන්නේ කෙසේද, කැබිනට් මංඩලය, පාර්ලිමේන්තුව සහ ජාතික විධායක මණ්ඩලය තුළ වෙන්වෙන් වූ යෝජනාවන් වෙනස්කම් වලට භාජන වෙමින් වර්ධනය වන්නේ කෙසේද යනාදිය සම්බන්ධයෙන් වූ සවිස්තර තොරතුරු මහජන අවකාශය තුළ ඇත්තේම නැති තරම්ය යන කරුණ පිළිබඳව අපගේ සැලකිල්ල වැඩි වශයෙන් යොමුවෙමින් පවතී. විශේෂයෙන්ම දීර්ඝකාලීන ප්‍රජාතාන්ත්‍රික රටක් වන ශ්‍රී ලංකාව වැනි රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යනු රජයට සහ දේශපාලන පක්ෂවලටම සීමාවූ කරුණක් නොවන අතර පාර්ලිමේන්තුවේ නියෝජනය වන පක්ෂ අතර ප්‍රතිසංස්කරණ ආකෘතිය සහ අන්තර්ගතය ගැන සාකච්ඡා සිදුවන ආකාරය පිළිබඳව ජනතාව පූර්ණ ලෙස දැනුවත්ව තැබීම තීරණාත්මක වැදගත්කමක් දරයි.

ජනාධිපති සිරිසේන මහතාට පැහැදිලි ජනවරමක් (Mandate) පැවරුණු වැඩසටහන ඉක්මනින් ක්‍රියාවට නැංවීමේදී කාලය සහ සම්පත් හි සීමාවහි මගින් ඇති කෙරෙන පීඩනය පිළිබඳව අපි සවිඥානිකව සිටිමු. නමුත් ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය පිළිබඳව තොරතුරු පැතිරවීමේ හා බෙදාහදා ගැනීමේ මහජන සහභාගිත්වය සහ අදහස් විමසීම දිරිගැන්වීමේ දී මෙන්ම තීරණ ගැනීම පිළිබඳව වන විනිවිදභාවය සහතික කිරීමේ ද මීට වඩා යමක් කළ හැකිව පවතින බව අපි සිතමු. මෙම අරමුණු උදෙසා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කොටගත හැකි පූර්ණ මට්ටමටම එය සිදු නොවන බව අපගේ නිරීක්ෂණයට බඳුන්වී ඇත. මෙය මැතිවරණ ක්‍රියාදාමය තුළ ඔවුන් මහජන සංවාදයන් උද්දීපනය කිරීම පිණිස සන්නිවේදන තාක්ෂණය නිර්මාණශීලී ලෙස උපයෝගී කොටගත් ආකාරයෙන් බෙහෙවින්ම වෙනස්වූ තත්ත්වයකි. වඩාත් පුළුල් ලෙස කිවහොත් ජාත්‍යන්තර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන යහ භාවිතයන් මගින් ස්ථාපිත කොට ඇති විනිවිදභාවය සහ සහභාගිත්වය පිළිබඳව වූ මූලික ප්‍රමිතීන් පවා වත්මන් ක්‍රියාදාමයෙහි ස්වභාවය සහ ආකෘතිය මගින් නොසැපිරෙන බව කිව යුතුව ඇත. එම යහභාවිතයන් පිළිපැදීම මගින් ක්‍රියාවලියෙහි ක්‍රමවත් භාවය සහ ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්වයෙහි ඇති තීරණාත්මක අවශ්‍යතාව අතර තිබිය යුතු සමතුලිතතාව සහතික කෙරේ. අතිශය අවමවූ අවශ්‍යතාවයක් ලෙස අප රජයෙන් දැඩි ලෙසම ඉල්ලා සිටින්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත් පනතේ අවසන් කෙටුම්පත ප්‍රකාශයට පත්කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර අවම වශයෙන් සති දෙකක කාලයක්වත් මහජන සාකච්ඡා හා විවාද සඳහා ඉඩකඩ සලසන ලෙසයි.

විවෘත සාකච්ඡාව, විවේචන සහ සමාලෝචන වලට බඳුන්වීම මගින් ප්‍රතිසංස්කරණ යෝජනා නිසැක ලෙසම ගුණාත්මක ලෙස වැඩි දියුණුවේ. තමන් පාලනය වන විධිවිධානයන් හී සිදුවෙමින් පවතින වෙනස්කම් පිළිබඳව ජනතාවගේ අදහස් විමසීමක් සිදුවීම පමණක් නොව ඔවුන්ගේ අදහස් සක්‍රීය ලෙස සැලකිල්ලට ගනු ලබන බව පෙනී යාමද සිදුවේ නම් ප්‍රතිසංස්කරණයන් හි කල්පවතින සුලුබව සහ සුජාත බව එමගින් ඉහළ නැංවෙනු ඇතැයි අපි දැඩි ලෙස විශ්වාස කරමු. තම පුද්ගලික ලාභාපේක්ෂා පදනම් කොටගෙන ඇතමුන් විසින් ප්‍රතිසංස්කරණ වලට එරෙහිවීමට ඇති අවකාශයද මෙමගින් බොහෝ දුරට අවම කෙරෙනු ඇත. කුමන ආකාරයකින් වුවද ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය කඩාකප්පල් නොවේ නම් එය ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත පිණිසම හේතුවනු ඇත.

මේ සම්බන්ධයෙන්, පසුගිය ජනාධිපතිවරණයේදී පරාජිත අපේක්ෂකයා වෙත තම ඡන්දය පාවිච්චි කළ සැලකිය යුතු තරම් විශාල වන ඡන්දදායකයන් පිරිස වෙතද ළඟාවීමේ මූලික වගකීමක් රජය සතුවන බව මෙහිදී අවධාරණය කොට දැක්වීම වැදගත්ය. නව ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය සහ එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රික ව්‍යුහයන් ගොඩනැංවීමේ දී ජනමතයේ සියලුම අංශ සමග සම්බන්ධ වී කටයුතු කිරීම සහ ඔවුන් ඇතුළත්කර ගැනීම සිදු කල යුතුම වූවකි. එහිදී ජනාධිපති සිරිසේන මහතා වෙත ලැබුණු ජන වරමේ සුපිළිපන් බව අනතුරට හෙළීම හෝ යහපාලනය සඳහා වන බහුතරයක් වූ ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාව සහ දැඩි කැමැත්ත දියකර හැරීම සිදුනොකළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා වන ජනවරමකට අමතරව ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය පිළිබඳව වූ සරුසාර මහජන කතිකාවතකද පසුගිය ජනාධිපතිවරණය මගින් ජනනය විය. මෙය මෙසේ දිගටම පැවතිය යුතුවා පමණක් නොව ලැබූ ජනවරමේ සැබෑ ජීව ගුණය ද සමග මෙම ක්‍රියාදාමයේ විනිවිද භාවය සහ මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම පිනිස කඩිනම් පියවර ගැනීම මගින් ජනතා අදහස් වලට ගරුකිරීම සහතික කිරීමට රජය ක්‍රියාකළ යුතුමය.

*කරුණාකර ඉතිරි කොටස පිටත කවරයේ ඇතුළු පැත්ත බලන්න......*

දින 100යේ ක්‍රියාදාමයෙන් ඔබ්බට වූ, අපගේ සැලකිල්ල යොමුවීමේ ශක්‍යතාවයක් සහිත අනෙකුත් වර්ධනයන් ගණනාවක් ද පවතී. ඒ නව රජය තෝරාපත්කර ගනු ලැබීමේ ප්‍රධාන අරමුණක්ද වූ මූලික ප්‍රජාතාන්ත්‍රික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්මයන් නැවත ස්ථාපිත කිරීමේ පැත්තෙන් බලන විට පෙනීයන්නාවූ වර්ධනයන් සමහරකි. මොහාන් පීරිස් මහතා අගවිනිසුරු ධූරය අත්පත් කරගත් ආකාරයේ පැවති අනීතික භාවය සහ සුජාත බවින් තොරවීම කිසිදු ආකාරයක සැකයක් නොමැති වූ කරුණක් වූ නමුදු ඔහු ඉවත්කරනු ලැබූ ආකාරයේ නිවැරදිභාවය පිළිබඳව අපට යම් සැක සංකා තිබේ. ඒ විධායකය සහ අධිකරණය අතර තිබිය යුතුවන්නාවූ නිසි සම්බන්ධතා කෙරෙහි එමගින් ඇති කරනු ලැබිය හැකි පල විපාක පිළිබඳවය. මෙම පූර්වාදර්ශය අනාගතයේදී මීට වඩා සාධාරණීකරණය කිරීමට අපහසු අරමුණු සඳහා ද උපයෝගී කොට ගැනීමේ ඉඩකඩක් දැන් පවතී. නමුත් වඩා ආසන්නතම වශයෙන් රජය සහ නීතිඥ සංගමය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ගය හා බැඳී පවතින තාක්ෂණික කූටෝපක්‍රමයක ආකාරයක් පවතී. මෙහි දැඩි ලෙසම පැවති නීත්‍යානුකූල භාවය පිළිබඳ කිසිදු සැකයක් නොපැවතිය ද අප සිහි තබාගත යුතු කරුණක් වන්නේ තීරණයන් හා ක්‍රියාපටිපාටීන් හි සුජාතභාවය පිළිබඳව මහජනතාව දකින ආකාරයද ප්‍රජාතන්ත්‍රවාදී රටකදී නීත්‍යානුකූලභාවය සේම වැදගත් වන බවයි. අවම වශයෙන් පීරිස් මහතා ධූරයෙන් ඉවත් කිරීමට පෙර එසේ කිරීමට පක්ෂව පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගැනීමට රජය කටයුතු කළේවී නම් මෙම සැක සංකා මග හරවා ගන්නට ඉඩ කඩ තිබිණි. ඒ ඊට වඩා දුෂ්කර ක්‍රියා පටිපාටීන් ප්‍රායෝගික නොවන බව සැලකෙන තත්වයකදී ය. පාර්ලිමේන්තුව තුළ එබඳු එකඟතාවක් ලබා ගැනීම මගින් මෙම තනතුරෙන් ඉවත් කිරීම වෙත අභියෝග කළ නොහැකි සුජාතභාවයක් දිනාගැනීමේ සරු ප්‍රතිලාභය ලබාගත හැකිව තිබිණ. එය හුදු තාක්ෂණික නෛතික අවංකභාවය ඉක්මවන්නක් වේ. එමෙන්ම එමගින් මෙම ක්‍රියාදාමයේ දී විධායකයේ සහ නීතිඥ සංගමයේ භූමිකාව පිළිබඳව පැනනැගිය හැකි සැක සංකා පිළිබඳව පවත්නා ඉඩකඩ ද අහෝසි කරවන්නක් වෙයි.

එසේම, දූෂණ සහ අනෙකුත් අක්‍රමිකතා පිළිබඳව විභාග කිරීම්, පැවති රෙජීමය විසින් පත්කරන ලද නිලධාරීන් ඉවත් කිරීම් (අල්ලස් සහ දූෂණ පිළිබඳ චෝදනා විභාග කිරීමේ කොමිෂන් සභාවේ ප්‍රධානියා වැනි) යනාදිය සිදුකළ යුතේතේ වීදි උද්ඝෝෂණ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අධිකරණ බලධාරීන් හට පමණක් වෙන්කරනු ලැබ ඇති කාර්යයන් දේශපාලකයන් විසින් බලහත්කාරයෙන් පවරාගැනීම වැනි ක්‍රම වලින් නොව නීතියට අනුව කටයුතු කිරීම මගිනි. මේ සියලු චෝදිත වැරදි ක්‍රියා පිළිබඳව විභාග කිරීමේ දී සහ ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ ද දැඩි ක්‍රියා පටිපාටිමය සහ හරයාත්මක (substantive) නීත්‍යානුකූලභාවයක් අනුගමනය කළයුතුය. ශ්‍රී ලංකාවේ ජනතාව ජනවාරි මස පැවති මැතිවරණයේ දී තම ඡන්දය පාවිච්චි කිරීමේ දී ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදී රටෙහි. අසාධාරණයන් සහ දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කළ යුත්තේ නිසැකවම එයට සුදුසු ආයතනික මාර්ගයන් ඔස්සේ මිස "කලහකාරීන්ගේ යුක්තිය පසිඳලීම (Mob Justice)" ට වඩා මදක් හොඳයැයි සැලකෙන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් නොවේ.

මෙවර නිදහස් දිනය සැමරීම දී වැනි අවස්ථාවලදී  රජය විසින් සිදුකරන ලද සමගි සන්ධානය දෙසට වූ සංකේතාත්මක ඉඟි කිරීම් කිහිපය සතුටින් පිළිගන්නා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යුද ගැටුම පැවති කාලය තුළදී මුල් බැස ගන්නා ලද ඇතැම් පියවර සහ භාවිතයන් තවදුරටත් දිගින් දිගටම පැවතීම පිළිබඳව කනස්සල්ලට පත් වේ. විශේෂයෙන් ම, සාමය පවතින කාලයකදී පොලීසිය විසින් පමණක්ම ඉටුකළ යුතු නීතිය හා සාමය පවත්වාගැනීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා සන්නද්ධ හමුදා අනුයුක්ත කිරීම ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම වැනි ක්‍රියාවන් පිළිබඳව කිසිඳු සාධාරනීකරණයක් තිබිය නොහැකි වන බව අපි විශ්වාස කරමු. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නෛතික ප්‍රතිපාදන මෙන්ම සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳව වූ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR) යටතේ ශ්‍රී ලංකාව බැඳී ඇති ජාත්‍යන්තර යුතුකම්වලින් පැහැදිලි කෙරෙන පරිදි සිවිල් බලයට සහය පිණිස සන්නද්ධ හමුදා කැඳවීම, නීත්‍යානුකූල, අවශ්‍ය සහ අවශ්‍යතාවයට සමානුපාතික වන්නේ ජන ප්‍රජාවගේ ජීවිතයට පැහැදිලි සහ සැබවින්ම පවත්නා අනතුරක් ඇතිවිටකදී පමණය. වත්මන් ශ්‍රී ලංකාවේ එවැනි කිසිඳු අවශ්‍යතාවයක් පවතීයැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නොදකී.

මේ සම්බන්ධයෙන් අප දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව ඉල්ලා සිටිමින් පැවති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කිරීම පිළිබඳව වන ඉල්ලීම නැවතත් ප්‍රකාශ කර සිටීමට අපට සිදුවේ. එමෙන්ම අවශ්‍ය විටෙක දී එය වෙනුවට වත්මන් ලෝකයේ ක්‍රියාත්මක ජාත්‍යන්තර ප්‍රමිතීන් හට අනුකූල නීතිකරණයන් ගෙනෙන ලෙසද අපි ඉල්ලා සිටිමු. තවද, එම නීතියේ දැඩි ලෙස අසාධාරණ වූ ප්‍රතිපාදන යටතේ දීර්ඝ කාලයක් තිස්සේ තම නිදහස අහිමි කරවනු ලැබ හා බොහෝ අවස්ථාවලදී වද හිංසා පැමිණවීමට සහ වෙනස්කම් කරනු ලැබීමට ලක්ව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් විශාල සංඛ්‍යාවක් නිදහස් කිරීමට අවශ්‍ය පියවර හැකිතරම් කඩිනමින් ගන්නා ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම අහෝසි කරනු ලැබූ හදිසි අවස්ථා රෙගුලාසි වෙනුවට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පනවනු ලැබූ රෙගුලාසීන් ද තවමත් දිගින් දිගටම බල පැවැත්වෙමින් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අවධානයට යොමු වේ. ඒවා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා විරෝධී හා එබැවින් නීතිය ඉක්මවූ මෙන්ම අපගේ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳව වූ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR) අනුව වූ බැඳීම් උල්ලංඝනය කරන ආකාරයේ ඒවා වේ. ඒවා නොපමාව ඉවත් කළයුතුය.

අපගේ මෙම සාධනීය විවේචන ඒවා කරනු ලබන හිතවාදී ජීව ගුණයෙන් යුතුව රජය විසින් සැලකිල්ලට ගනු ලබනු ඇතැයි ද එමෙන්ම ඒ පිළිබඳව කටයුතු කිරීමට පියවර ගනු ලබනු ඇතැයි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලාපොරොත්තු වේ. මෙම සැලකිලිමත් විය. යුතු කරුණු කෙරෙහි අර්ථාන්විත ප්‍රතිචාර දැක්වීම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ ඉඩප්‍රස්තාවන් හා ගුණාත්මක භාවය ඉහළනැංවීමට බෙහෙවින්ම දායක වනු ඇති අතර සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී, බහුත්ව සහ එක්සත් ශ්‍රී ලංකාවක යහපත පිණිස වන හරයාත්මක ප්‍රතිසංස්කරණයන්හි ආපසු හැරවිය නොහැකි බව ද එමගින් තහවුරු වනු ඇත.